# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව
**දිනය** : 2013.05.28
**වේලාව** : පෙ.ව. 10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:**

1. ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා
2. ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රී ආ්. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා
9. ගරු නාගරික මනත්‍රී එම්. ජේ. මලික්ෂා මැතිතුමා

**නිලධාරී සහභාගීත්වය**

1. ලේකම් එම්. එච්. සීලවතී මිය

## 01 ආගම සිහි කිරීම:

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

එය සංශෝධනයන් කිහිපයකට යටත්ව කියවූ ලෙස සලකා මහා සභාවේ ඒකමතිකව සම්මත කරන ලදී.

## 03. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

ගරු සභාපතිතුමා සභාව අමතමින් මේ පවත්වන්නට යෙදෙන්නේ 2013 වර්ෂයේ මැයි මාසයට අදාල මහා සභා රැස්වීම බව දැනුම් දෙන ලදී.

ගරු සභාපතිතුමා වැඩිදුරටත් සභාව අමතමින්, මෙවර වෙසක් උත්සවය බළන්ගොඩ පොලිසිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ නගරයේ සියළු විහාරස්ථානයන්හි නායක ස්වාමීන් වහන්සේලා මෙන්ම වෙළඳ ප්‍රජාව ද සමඟ එක්ව අලංකාරව සහ අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට හැකියාව ලැබුණු බවත්, ඒ සම්බන්ධව සහයෝගය දැක්වූ සියළුම දෙනාට සභාවේ ස්තූතිය හිමි වන බවත් සඳහන් කළේය. එමෙන්ම එළැඹෙන පොසොන් උත්සවය ද ඒ අයුරින්ම පැවැත්වීමට හැකියාව ලැබෙනු ඇති බවට ද විශ්වාසය පළ කළේය.

පසුගිය කාලයේ පැවැත්වීමට තිබූ වර්ජන රැල්ල අසාර්ථක වූ බව ද අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන් විසින් විදුලි බිල අඩු කිරීමට කටයුතු කළ බව ගරු සභාපතිතුමන් අදහස් දක්වමින් ප්‍රකාශ කළේය. නගර සභාවේ අරමුණ වන්නේ සභා අරමුදල් මෙන්ම රජයෙන් ලැබෙන ප්‍රතිපාදනද යොදා ගනිමින් ජනතාවට සේවය සැලසීම බව ද, ඒ සඳහා සියළු දෙනාගේම සහයෝගය ලැබෙනු ඇති බවට ද වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

### 04:01 ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා

04:01:01 පසුගිය 2013.04.30 දිනැති සභා වාර්තාවේ 05 වන පිටුවේ යෝජනා අංක **'08:04 වැලිහරණාව උපුල් මහතාගේ නිවස දක්වා මාර්ගය පඩි යොදා සැකසීම කර්මාන්තය'** යටතේ අදාල ඇස්තමේන්තුගත රු. 101,002.28 මුදල් ප්‍රමාණය රු. 112,8820.95 ලෙස දැක්වීම කළ යුතු බවට ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. එය නිවැරදි කිරීමක් වශයෙන් 2013.05.28 වන දිනැති මහා සභා වාර්තාවේ සඳහන් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලද අතර, ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී. ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමාට අදාල 2013 අයවැය ප්‍රතිපාදන මගින් වැඩිකරන ලද මුදල් ප්‍රමාණය ද පියවීමේ පදනම මත එම යෝජනාව මහා සභාවේ සම්මත විය.

ඒ අනුව සංශෝධිත යෝජනා ස්ථිරත්වය පහත පරිදි වේ.

### *08:04 වැලිහරණාව උපුල් මහතාගේ නිවස දක්වා මාර්ගය පඩි යොදා සැකසීම කර්මාන්තය*

*වැලිහරණාව උපුල් මහතාගේ නිවස දක්වා මාර්ගය පඩි යොදා සංවර්ධනය කිරීම කර්මාන්තය සඳහා වන රු. 112,8820.95ක වියදම් ඇස්තමේන්තුව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.*

*එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.*

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය හා කර්මාන්ත ප්‍රගතිය ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර පසුගිය මහා සභාවේ සම්මත වූ පරිදි මහජන පොලට පැමිණෙන ජනතාවට පානීය ජලය සැපයීම සහ බස් නැවතුම්පොල පිරිසැකැස්මක් සවි කිරීම සම්බන්ධව සභාවේ වැඩ අධිකාරී වෙත නැවත සිහි කැඳවීමට යටත්ව එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා නමින් කෙරෙන නම් කිරීම්

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා නමින් ගොඩනැගිලි, රංගශාලා, විදුහල්, මාර්ග හා වෙනත් විශේෂ ස්ථාන නම් කිරීමේ දී ඒ සම්බන්ධයෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතු බවට සබරගමුව පළාත් පාලන කොමසාරිස් විසින් එවන ලද ජනාධිපති ලේකම් විසින් සිදු කරන ලද දැනුම් දීම මහා සභාවේ දැන ගැනීම පිණිස ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී.

**06:02 පෞද්ගලික බස් ගාස්තු අය කිරීම - එම්. ජී. පියසේන මයා**

2013.05.01 වන දින බස් ධාවනය අඩු බැවින් එදින රාජකාරී කටුයුතු සිදු නොකළ බව දන්වා පෞද්ගලික බස් බදු අයකරු විසින් දන්වා ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, එදිනට ගාස්තුවෙන් නිදහස් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ඒකමතිකව සම්මත විය.

**06:03 බස්නැවතුම්පොල වෙළඳ සංකීර්ණයේ සී 46 ඒ දරන කඩ කාමරය පැවරීම - ජී.එස්.එල්. සිල්වා මයා**

බස් නැවතුම්පොල වෙළඳ සංකීර්ණයේ උඩු මහලේ සී 46 ඒ දරන කඩ කාමරය තම ඥාති සොහොයුරකු වන බළන්ගොඩ, උඩගම, පින්නවල පදිංචි සමරසිංහ මුදියන්සේලාගේ අජිත් කීර්තිනායක යන අය වෙත පවරා දීමට දැනට එම කඩ කාමරය හිමි පී. එස්. එල්. සිල්වා යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව දැනුම් දුන් ගරු සභාපතිතුමන් එම කඩ කාමරය මාස 06ක තැන්පත් මුදල් හා මාස 03ක කුළිය මත ලබාගෙන පවරා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:04 පුවක්ගහමුල්ල පාර කාණු පද්ධතිය පිළිසකර කිරීම - එම්. ඩබ්. ආරියදාස මයා**

පුවක්ගහමුල්ල පාරේ ජලය බැස යාමට ඇති කාණු පද්ධතිය අබලන් වී ඇති බව හා එහි ජලය පාණීය ළිඳකට ගලා යන බව මෙම සභාවට වාර්තා වී ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, පුවක්ගහමුල්ල කාණු පද්ධතිය සභා අරමුදලින් ප්‍රතිසංස්කරණය කර දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06:05 පෞද්ගලික බස්ගාල් ගාස්තු අය කිරීම - එම්. ජී. පියසේන මයා**

2013.04.30 වන දින පැවති මහා සභා රැස්වීම් තීරණ අංක 06:10 යටතේ 2013.04.13 සහ 2013.04.14 යන දිනයන් ගාස්තු නිදහස් කළ අතර, 2013.04.15 සහ 2013.04.16 යන දිනයන් හි දී ද, බස් ධාවනය නිසි පරිදි සිදු නොවූ බැවින් සේවයට වාර්තා නොකිරීමෙන් එම දිනයන් සඳහා ගෙවීමට නියමිත ගාස්තුවෙන් නිදහස් කර දෙන මෙන් පෞද්ගලික බස් බදු අයකරු විසින් බළන්ගොඩ බස් නැවතුම්පොල ස්ථාන භාර නිලධාරීගේ ලිපියක් ද සහිතව ඉල්ලා ඇති බව ද, එමෙන්ම වෙසක් පොහොය නිවාඩු පැවති 2013.05.24 හා 2013.05.25 යන දෙදින සඳහා ද ගෙවිය යුතු ගාස්තුවෙන් නිදහස් කර දෙන මෙන් ඉල්ලා ඇති බව ද ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, එම දිනයන්ට අදාල ගාස්තුව නිදහස් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:06 185/22, වෙළඳසැල බදු අයිතිය පවරා දීම - ජී. අයිරාංගනී පුෂ්පා ප්‍රියානි මිය**

බස්නැවතුම්පොල ඉදිරිපිට 185/22 කඩ කාමරයේ බදු අයිතිය බළන්ගොඩ, කුරගල පාර, නන්ජන් තැන්න පදිංචි මොහිදීන් ලෙබ්බෙ හාරිදු මොහොමඩ් ෂහාන් යන අයට පවරා දීමට කැමැත්ත පළ කරමින් දැනට එම කඩ කාමරයේ බදු අයිතිය හිමි ජී. අයිරාංගනී පුෂ්පා මිය විසින් සභාවට දන්වා ඇති බව ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කළ අතර, මාස 06ක

තැන්පත් හා මාස 03ක කුළිය ලබා ගෙන එම කඩ කාමරය අදාල අයට පවරා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:07 සී18/ඒ කඩ කාමරයේ බදු අයිතිය වෙනත් අයෙකුට පැවරීම - ඊ. එම්. නිරෝෂා ප්‍රියානි මිය**

බලන්ගොඩ බස් නැවතුම්පොල වෙළඳ සංකීර්ණයේ සී 18/ඒ දරන කඩ කාමරයේ බදු අයිතිය බලන්ගොඩ පරගහකුඹුර පාර, අංක 12 ස්ථානයේ පදිංචි පී. වී. චන්ද්‍රදාස යන අයට පවරා දීමට ඊ. එම්. නිරෝෂා ජීවනී යන අය විසින් කැමැත්ත පළ කර මෙම සභාවට දන්වා ඇති බව ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලද අතර, මාස 06ක තැන්පත් මුදල් හා මාස තුනක බදු මුදල සභා ආදායම් ලෙස ලබාගෙන අදාල අයට එම කඩ කාමරය පවරා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධ අදහස් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:08 නිවාස ආධාර ලබා දීම**

බලන්ගොඩ, තුඹගොඩ, බැංකියවත්ත, එල්. 20, ස්ථානයේ පදිංචි පී. එම්. නන්දාවතී යන අයගේ නිවස මාර්ග පුළුල් කිරීමක් හේතුවෙන් කැඩී ඇති බවත්, ඒ වෙනුවෙන් නිවාස ආධාරයක් ඉල්ලා ඇති බවත්, ඇය අඩු ආදායම් ලාභියකු බවට තුමගොඩ ග්‍රාම නිලධාරී විසින් සහතික කර ඇති බවත් ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, එම මහත්මිගේ නිවස සාදා ගැනීම සඳහා ආධාරයක් වශයෙන් රු. 25,000.00ක මුදලක් සභා අරමුදලින් ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:09 සතිපොල ආදායම වෙසක් උත්සවය හේතුවෙන් අඩු වීම හා සතිපොල මඩු වෙළඳුන්ට ලබා දීම සම්බන්ධව සලකා බලා තීරණය කිරීම**

සතිපොල මඩු වෙළඳාම වෙසක් පොහොය හේතුවෙන් අඩු වී ඇති බව ගරු සභාපතිතුමන් විසින් සභාවට දැනුම් දුන් අතර, පොළෙහි වෙළෙඳාම් කරන වෙළෙඳුන්ගේ පැමිණීම සම්බන්ධයෙන් ගැටළු මතු වී ඇති බැවින් ඔවුන් සඳහා හැඳුනුම්පතක් නිකුත් කිරීමටත්, සෑම සතියක දීම එක් වෙළඳසැලක් සඳහා රු. 200.00ක් අය කිරීමටත් ඊට අමතරව රු. 1,000.00ක් බැගින් ලබා ගැනීමටත් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:10 කළමනාකරණ කමිටු පිහිටුවීම සඳහා නිලධාරීන් පත් කර ගැනීම**

මෙම සභාවේ කළමනාකරණ රැස්වීම් සෑම සතියකම පැවැත්වීම සුදුසු බවට ගරු සභාපතිතුමන් යෝජනා කරන ලද අතර, ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර හා අසංක නිල්මිණි විජයසිංහ යන ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා එම කමිටුව සඳහා පත් කිරීමටත්, සෑම මසකම දෙවන සතියේ බදාදා දින ප. ව. 3.00ට එම රැස්වීම පැවැත්වීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:11 කඩ කාමර වලින් ලැබෙන නව ආදායම්**

බස් නැවතුම්පොල ඉදිරිපිට කඩකාමර 22ක් හා කාර්පාක් ඉදිරිපිට කඩ කාමර 06ක් සඳහා මාසිකව රු. 1,500.00 බැගින් මසකට රු. 42,000.00ක ආදායමක් ලැබෙන බවත්, බස්නැවතුම්පොල අළුතින් වැසිකිළි ඉවත් කර සකස් කළ කඩ කාමර තුනකින් හා විදුලි කාමරයෙන් කල්දේරා යන අයට ලබා දුන් කොටසින් මසකට රු. 17,500.00ක ආදායමක් ලැබෙන බව ද, මෙ ආදායම වර්ෂයකට රු. 714,000.00ක මුදලක් වන බව ද ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

**06:12 භාණ්ඩ සමීක්ෂණය - 2012**

2012 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණය සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන් ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර, එම නිර්දේශයන් අනුව 2012 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණය අවසානයේ දී එහි නිර්දේශ අනුව 2013.03.14 වන දින භාණ්ඩ වෙන්දේසි කරන ලදී. එහි ආදායම රු. 16,085.90ක බව දැන්වූ අතර සභාවට ඉදිරිපත් කර ඇති එම වෙන්දේසි කරන ලද භාණ්ඩ හා විනාශ කරන ලද භාණ්ඩ පොතෙන් කපා හැරීමටත් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:13 බලන්ගොඩ මිහිඳු පෙරහැර සහ පොසොන් උත්සවය සඳහා දායකත්වය ලබා දීම**

මෙවර බලන්ගොඩ නගරයේ පැවැත්වෙන මිහිඳු පෙරහැර සඳහා රු. 25,000.00ක මුදලක් සහ පොසොන් උත්සවය සඳහා රු. 25,000.00ක මුදලක් සභා අරමුදලෙන් ලබා දීමට ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:14 ස්පාඤ්ඤයේ විගෝ විශ්ව විද්‍යාලයේ සමුළුවකට සහභාගී වීම**

ගරු උපසභාපතිතුමන් ස්පාඤ්ඤයේ විගො විශ්ව විද්‍යාලයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ වැඩසටහනක් සඳහා සහභාගී වීමට ආරාධනාවක් ලැබී ඇති බව ගරු සභාපතිතුමන් විසින් සභාවට දැනුම් දුන් අතර, අදාල වැඩමුළුව 2013.06.24 වන දින සිට 2013.06.29 වන දින දක්වා පැවැත්වෙන බව ද, ඒ සඳහා ගරු උපසභාපතිතුමන්ගේ පෞද්ගලික වියදමෙන් සහභාගී වීම සඳහා නිවාඩු අනුමත කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 07. රු. 10,000.00ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

මුදල් කමිටුවේ සම්මත කරන ලදී.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

අනුලා මහත්මියගේ නිවස දක්වා යන මාර්ගය සහ දුණුමඩලගහවත්ත චමින්ද මහතාගේ නිවස දක්වා මාර්ගය යන කර්මාන්තයන්හි වැඩ නිම කළ පසු ඇස්තමේන්තවලට අනුව මුදල් ඉතිරි වන බවත්, චමින්ද මහතාගේ නිවසට යන මාර්ගය කර්මාන්තයේ ඉතිරි වන මුදලින් එම මාර්ගයට සමීප දුණුමඩලගහවත්ත මාර්ගයේ කොටසක් සකස් කිරීමටත්, අනුලා මහත්මියගේ නිවසට යන මාර්ගය සකස් කිරීම කර්මාන්තයේ ඉතිරි වන මුදලින් බාන්ස්

රත්වත්ත මාවත කුසුම්සිරි මෝටර්ස් ඉදිරිපිට මාර්ගයේ ඉහලින් අනුලාවතී මහත්මියගේ නිවාස දක්වා පැමිණෙන කොටස සකස් කිරීමටත් යෝජනා කරන ලදී. යෝජනා නියමිත දුර සම්පූර්ණ කිරීමෙන් පසු (මීටර 35ක් ) සුනන්දාරාම අතුරු මාර්ගය හා හුණුකුඹුර අතුරු මාර්ග දෙකෙහි මග නැගුම - ග්‍රාමීය සංවර්ධන වැඩසටහන මගින් ලබා දී ඇති උපදෙස් වලට අනුව 55%ක මුදලකින් අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම අනිවාර්යයෙන් කළ යුතු නමුත්, මාර්ග දෙකෙහි දුර අනුව වැඩ නිම කළ පසු 55%ක් නිම වූ පසු ඇස්තමේන්තුවට අනුව වැය නොවේ. එබැවින් එම ඉතිරි වන මුදලින් මාර්ගයේ ආරක්ෂාව සඳහා පැති බැම් යෙදීම සුදුසු බවට යෝජනා කරන ලද අතර, පැතිබැම් කාණු වැනි ඉදිකිරීම් සඳහා වෙන් කළ පසු ඉතිරි වන 55%න් බ්ලොක් ඇතිරීම සම්පූර්ණයෙන් කළ හැකි වුවත් මුදල් ඉතිරි වේ. නමුත් පැතිබැම් ඉදිරියට යෙදීම සුදුසුයි. එහෙත් 45% ඉක්මවා පැති බැම් බැඳීමට අනුමැතිය අවශ්‍ය වේ.

උඩඇල්ලෙපොල ඩැනියෙල් මහතාගේ නිවස අසලින් සරස්වතී මාර්ගයට පිවිසෙන මාර්ගය (1 අදියර) කර්මාන්තය 45% මුදල ඉක්මවා පැතිබැම් යොදා මාර්ගයේ පාදම සකස් කිරීමට කටයුතු කිරීමට ද යෝජනා කරන ලදී.

එමෙන්ම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට යන මාර්ගය කර්මාන්තය වෙනුවෙන් වෙන් කර ඇති මුදලින් එම පරිශ්‍රයේ අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ඇල්ලීමට ද යෝජනා කරන ලදී.

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

### 09:01 2013 වර්ෂය සඳහා බළන්ගොඩ නගර සභාවට අයත් පොදු වෙළඳසැල අංක 11 කඩ කාමරයට සුදුසු බදුකරුවන් තෝරා ගැනීම සඳහා ලංසුපත් කැඳවීම

ඉහත ලංසු කැඳවීමට අදාලව කිසිදු ලංසු පත්‍රයක් නිකුත් නොවූ බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දෙන ලදී. එබැවින්, 10%කින් ලංසු මුදල අඩු කර පුවත්පත් දැන්වීම් පළ කිරීමකින් තොරව නැවත ටෙන්ඩර් කිරීමට යොජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඉදිරිපත් කර නොතිබුණි.

## 11. යෝජනා

### 11:01 ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා

ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙන පහත යෝජනාවන් සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

11:01:01 පුස්තකාලයට ඇතුල්වන පඩි පෙල පාවිච්චියට පහසු ආකාරයට සකස් කිරීම

11:01:02 ළදරු පාසැලට පිවිසීමට ඇති මාර්ගය ප්‍රධාන පාරෙන් ඇතුල් වීමට සකස් කිරීම

ඉහත යෝජනාවන් ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. මේ සම්බන්ධව නැවත සලකා බැලීමෙන් පසුව ඉටු කිරීම සුදුසු බවට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**11:02 ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත යෝජනාවන් ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී.

11:02:01 අත්තනෝමතික ලෙස රත්නපුර - බළන්ගොඩ මාර්ගයේ එච් එල් ඩබ්ලිව් ඉන්ධන පිරවුම්හල අසළ පස් කන්ද කැපීමට අවසර දීමට විරෝධය දැක්වීම.

11:02:02 ජේ. එෆ්. ආයතනයට සම්බන්ධ ගොඩනැගිලි සංවර්ධන කටයුතු වලින් නගර සභාවට අය විය යුතු මුදල් අය කර ගැනීමට කටයුතු කරන මෙන් ඉල්ලීම.

රත්නපුර බළන්ගොඩ මාර්ගය අසල පස් කැපීම නිසා එම පස් සෝදා යාමෙන් කුඹුරු වල මඩ තැන්පත් වීම හේතුවෙන් ගොවීන් දැඩි අපහසුතාවයකට පත්ව සිටින බව ද, මේ හේතුවෙන් නාය යාමේ අවදානමක් ඇති බව ද, පසුගිය දින කිහිපය තුළ එම ස්ථානයේ පස් වල ලිස්සා යාමෙන රිය අනතුරු කිහිපයක් සිදු වූ බව ද, දැඩි දූවිල්ල හේතුවෙන් අවට ප්‍රදේශවාසීන් දැඩි අපහසුතාවයකට පත්ව ඇති බව ද, ඒ සම්බන්ධයෙන් සියළු දෙනා වෙනුවෙන් විරෝධය දක්වන බව ද පවසමින් ඉහත යෝජනාවන් ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහි ඉහත 11:01:01 යෝජනාවට අදාල පස් කැපීමට මෙම සභාව මුල දී අනුමැතිය ලබා දීම සිදු නොකරන ලද බවත්, පසුව අදාල ආයතනය විසින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු එය නැවත ආරම්භ කරන ලද බවත් මේ සම්බන්ධව අදහස් දක්වමින් සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම යෝජනා අංක 11:02:02ට අදාලව ව්‍යාපාර මාරු කිරීම සම්බන්ධව එම ආයතනයට උපදෙස් ලබා දී ඇති බව ද ගරු සභාපතිතුමන් විසින් දන්වන ලදී.

**11:03 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

ගරු උපසභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද පහත යෝජනාව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

11:03:01 බළන්ගොඩ මූලික රෝහලේ අපද්‍රව්‍ය සභාවෙන් එකතු කිරීම සම්බන්ධ ගැටළුකාරී තත්ත්වය සාකච්ඡා කිරීම

11:03:02 බළන්ගොඩ මිහිඳු පෙරහැරට සහ පොසොන් උත්සවයේ කටයුතු සඳහා මූල්‍යාධාර ලබා දීම

පසුගිය සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටු රැස්වීමේ දී ද ප්‍රකාශ කළ පරිදි රු. ලක්ෂ 05ක පමණ මාසික ගාස්තුවක් අය කරමින් රෝහලේ කසළ කළමනාකරණ කටයුතු කොන්ත්‍රාත්තුව භාරගෙන සිටින පෞද්ගලික ආයතනය එය නිසි පරිදි සිදු නොකරන බැවින්, මෙම කොන්ත්‍රාත්තුව සඳහා ලබන වර්ෂයේ දී අදාල විෂය දැනුම සහ සම්පත් ද ඇති බැවින් මෙම සභාවෙන් ඉල්ලීම් කිරීම සුදුසු බවට සඳහන් කරමින් එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

වාර්ෂිකව පවත්වනු ලබන බළන්ගොඩ මිහිඳු පෙරහැර සඳහා රු. 25,000.00ක මුදලක් සහ පොසොන් උත්සවයේ කටයුතු සඳහා රු. 25,000.00ක මුදලක් සභා අරමුදලෙන් ලබා දීමට ද ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ද ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් එම යෝජනාවන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:04 ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

තමන් විසින් ඉදිරිපත් කරන පහත යෝජනාවන්ට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යොජනා කරන ලදී.

11:04:01 නගර සභාව සතු හට් දෙක අබලන්ව ඇති බැවින් ඒ සඳහා ටකරන් මිල දී ගැනීමට සහ අළුත්වැඩියා කටයුතු සඳහා මුදල් වෙන් කර ගැනීම

11:04:02 ප්ලාස්ටික් හා පොලිතින් ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානයේ පරිපාලන කටයුතු සඳහා පෞද්ගලික අංශය සමඟ ගිවිසුමකට එළැඹීම

11:04:03 බෝම්බුව 'මෙත් සිත්' අවමංගල්‍යාධාර සමිතියට හට් එකක් ලබා දීම.
- 2013 අයවැය ප්‍රතිපාදන

11:04:04 කොටුගොඩැල්ල 'ප්‍රජාශක්ති' සුභසාධන සමිතියට හට් එකක් ලබා දීම
- 2013 අයවැය ප්‍රතිපාදන

එම යෝජනාවන් ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:05 ගරු නාගරික මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමන් විසින් 2013 අයවැය ප්‍රතිපාදන සඳහා යෝජනා වශයෙන් ඉදිරිපත් කර ඇති පහත යෝජනාවනට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී.

11:05:01 බලගහමුල සේනක පෙදෙසේ, ලියාපදිංචි අංක ප්‍රාලේ/බ/ස්වේ/සං/01/2011 දරන අවිහිංසා සහන සංවිධානයට ටකරං මඩුවක් ලබා දීම.
- රු. 50,000.00

11:05:02 ගොරොක්ගහමඩ ප්‍රධාන මුස්ලිම් පල්ලියට ටකරං මඩුවක් ලබා දීම
- රු. 50,000.00

11:05:03 බළන්ගොඩ දොරවෙල ලියාපදිංචි අංක බ/ප්‍රා/ස්වේ/සං/3/92 දරන එක්සත් පොදු සේවා සමිතියට හැලි වලං ලබා දීම සඳහා - රු. 50,000.00

ඉහත යෝජනාවන් ගරු නාගරික මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, ගරු නාගරික මන්ත්‍රීතුමන් විසින් සුදුසු ස්ථානයකින් ඉල්ලා ඇති වටිනාකමට හට් සහ වලං ලබා ගැනීමෙන් පසු අදාල බිල්පත් පියවීමට යටත්ව එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 12. ආදායම් වියදම් හා වෙනත් වාර්තා ඉදිරිපත් කිරීම

### 12:01 2013 අප්‍රේල් ලැබීම් විග්‍රහය

- 2013 අප්‍රේල් මාසය සඳහා වන ලැබීම් විග්‍රහය සභාවේ අනුමත විය.

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 3,501,540.29 |
| වෙනත් ලැබීම් | 5,928,505.00 |
| **මුළු ලැබීම්** | **9,430,045.29** |
| පුනරාවර්තන වියදම් | 4,964,626.86 |
| වෙනත් වියදම් | 9,042,571.55 |
| **මුළු වියදම්** | **14,007,198.41** |

- බළන්ගොඩ තානායමේ 2013.04.01 සිට 2013.04.30 වන දින දක්වා වෙළඳ හා ලාභ අලාභ ගිණුම සභාවට ඉදිරිපත් කරන ලදී.

ඉහත වාර්තාවන් සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 12:02 2013.04.01 සිට 2013:04.30 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාවන්

2013.04.01 සිට 2013.04.30 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාල මුළු ඉන්ධන වියදම රු. 538,101.95කි.

ඉහත ඉන්ධන වියදම් වාර්තාවන්ට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 13. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

### 13:01 සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාව

2013.05.13 වන දිනැති මෙම සභාවේ සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභා වාර්තාවට අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූ හෙයින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 13:02 කර්මාන්ත හා සංවර්ධන කාරක සභාව

2013.05.22 වන දින පැවති මෙම සභාවේ කර්මාන්ත හා සංවර්ධන කාරක සභා වාර්තාව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 13:03 මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව

2013.05.22 වන දින පැවති මෙම සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 13:04 තානායම් කාරක සභාව

2013.05.22 වන දින පැවති තානායම් කාරක සභා වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 14. වෙනත් කරුණු:

### 14:01 ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා:

ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා මහා සභාව අමතමින්, බැංකියවතත ප්‍රදේශයේ අසරණ පවුලකට නිවාස ආධාර ලබා දීම සඳහා මුදලක් වෙන් කිරීමට යෝජනා

කරන බව ද, එම ප්‍රදේශයේ පදිංචිකාරියක වන ටී. එම්. නන්දානි මහත්මියගේ නිවසට වර්ෂාකාලයේ හානි සිදුවී ඇති බව ද සඳහන් කළේය.

එමෙන්ම පසුගිය දින මහනුවර ශ්‍රී දළදා මාළිගාව ඉදිරිපිට දී ජීවිතය පූජා කරන ලද පූජ්‍ය බෝවත්තේ ඉන්ද්‍රරතන හිමියන්ගේ අපවත් වීම සම්බන්ධව ශෝකය ප්‍රකාශ කරන බව සඳහන් කළේය. උන් වහන්සේ ජීවිත පූජා කරන ලද්දේ පෞද්ගලික ලාභයක් ලබා ගැනීමට නොවන බවත්, කාලාන්තරයක් තිස්සේ ගවඝාතනය වැළැක්වීමට, රටේ ඒකීය භාවය හා බෞද්ධ සංස්කෘතිය ආරක්ෂා කිරීම සම්බන්ධව සිදු කරන ලද ඉල්ලීම් වලට පිළියමක් නොලැබීමට විරෝධය පළ කිරීමක් වශයෙන් බවත් එතුමන් වැඩිදුරටත් සඳහන් කළේය. උන්වහන්සේ විසින් ජීවිත පූජාවෙන් අපේක්ෂා කරන ලද අරමුණ ඉටු කර දීමට කටයුතු කළ යුතු බවට ද ගරු නාගරික මන්ත්‍රීතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

**14:02 ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා**

අරමුණක් ඉටු කර ගැනීම වෙනුවෙන් ජීවිතය පූජා කළ කහවත්ත ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පූජ්‍ය බෝවත්තේ ඉන්ද්‍රරතන හිමියන්ගේ අපවත්වීම සම්බන්ධයෙන් මුස්ලිම් ජනතාවගේ ශෝකය පළ කරන බව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

පසුගිය වසර 45 දීම දක්නට නොලැබුණු තරම් උත්කර්ෂවත් වෙසක් උත්සවයක් මෙවර පැවති බව ද එතුමන් විසින් සඳහන් කළ අතර, අතිපූජ්‍ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහ නායක හිමියන්ගේ උපන් ප්‍රදේශය වූ බළන්ගොඩ පුරවරයේ එබඳු වෙසක් උත්සවයක් පැවැත්වීමට බළන්ගොඩ පොලිස් ස්ථානය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වෙළඳ ප්‍රජාව ඇතුලු නගර වාසීන් කටයුතු කළ බව දක්වන ලදී. ඉතා ඉහල මට්ටමෙන් දන්සල් පැවති බව සඳහන් කළ ගරු නාගරික මන්ත්‍රීතුමන්, තමන් මුස්ලිම් ජාතිකයකු වුවත් ඒ සම්බන්ධව සතුටු වන බවත්, මේ සඳහා කටයුතු කරන ලද සියළු දෙනාටම ස්තූතිය පල කරන බවත් සඳහන් කළේය.

එමෙන්ම, උතුරු පළාත් සභා මැතිවරණය පැවැත්වීම කළ යුතු වුවත් එම පළාත් සභා සඳහා පොලිස් හා ඉඩම් බලතල ලබා දීම නොකළ යුතු බව ද සඳහන් කළේය. වසර 30ක කාලයක් තිස්සේ පැවති යුද්ධය නිමා කරමින් අතිගරු ජනාධිපතිතුමන් විසින් ශ්‍රී ලාංකික ජනතාවට සාමය උදාකර දීම හේතුවෙන් අද දිවයිනේ ඕනෑම තැනකට ගමන් කිරීමට හැකියාව ලැබී තිබෙන බව ද, එම තත්ත්වය දිගටම ආරක්ෂා කර ගත යුතු බව ද, එහි පවත්වන මැතිවරණයකින් පසු ප්‍රධාන පක්ෂ දෙකෙන් පරිබාහිර පක්ෂයක් බලයට පැමිණීමට වැඩි ඉඩකඩක් පවතින බැවින් ඒ සම්බන්ධව වැඩි අවධානයක් යොදා කටයුතු කළ යුතු බව සඳහන් කළේය. ඡන්දයකින් පත් වන පක්ෂයක් ඉඩම් හා පොලිස් බලතල ද සහිතව බලය ලබා දීමෙන් ඊලමක් ස්ථාපිත කිරීම පිණිස කටයුතු කිරීමේ අවදානමක් ඇති බව ද එතුමන් දක්වන ලද අතර මේ සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමන් වෙත දන්වා යැවීමට යෝජනා කරන ලදී.

**14:03 ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා අදහස් දක්වමින්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නාගරික මන්ත්‍රීවරයකු වශයෙන් උතුරේ පළාත් සභා මැතිවරණයක් පැවැත්විය යුතු ද නැද්ද යන්න සම්බන්ධව අදහසක් ප්‍රකාශ කිරීම අපහසු බව ප්‍රකාශ කරන ලද අතර, මේ වන විට ත්‍රිකුණාමලය මහ නගර සභාව මධ්‍යම රජය ද නොදැනුවත්ව ඇමරිකා එක්සත් ජනපදය සමඟ තොරතුරු තාක්ෂණ ගිවිසුමකට එළඹ තිබීම අයහපත් පෙර නිමිත්තක් බව ද සඳහන් කළේය.

වසර 30ක් තිස්සේ පැවති යුද්ධය හේතුවෙන් දූ දරුවන් රැසක් රටට අහිමි වූ බව ද, අතිගරු ජනාධිපතිතුමන් විසින් ආරම්භ කරන ලද මානුෂික මෙහෙයුමෙන් එම තත්ත්වයන් වලක්වා රට එක්සේසත්කර ඇති බව ද සඳහන් එතුමන් වැඩිදුරටත් සඳහන් කළේය. එමෙන්ම, 1987 වර්ෂයේ දී පළාත් සභා ක්‍රමය මෙරටට බලෙන් පැටවීමේ ඉන්දු - ලංකා ගිවිසුමට ශ්‍රී ලංකා

නිදහස් පක්ෂය අකැමති වූ බව පැවසූ ගරු මන්ත්‍රීතුමන්, වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් සුදුසු තීරණය නායකත්වය විසින් ගනු ඇති බවට විශ්වාසය පළ කරන ලදී.

මෙම නගර සභාව ආරම්භයේ සිට මේ දක්වා කටයුතු කළ ගරු සභාපතිතුමන්ලාගේ, උප සභාපතිතුමන්ලාගේ සහ නාගරික මන්ත්‍රීතුමන්ලාගේ නම් සඳහන් ලේඛනය යාවත්කාලීන කළ යුතු බවටත්, එම ලේඛනය දැනට තබා ඇති තැන වෙනුවට හොඳින් දර්ශනය වන පරිදි ස්ථානගත කළ යුතු බවට ද එතුමන් විසින් අදහස් දක්වන ලදී.

එමෙන්ම විදුලි පද්ධති අලුත්වැඩියා කිරීම් කටයුතු සඳහා විදුලි කාර්මිකයා සමග ප්‍රදේශයට අදාල ගරු නාගරික මන්ත්‍රීතුමන් ද සහභාගී වීමෙන් එම කටයුතු වඩාත් ඵලදායීව සිදු කිරීමට හැකි බවට ද එතුමන් විසින් අවධාරණය කරන ලදී.

**14:04 ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා**

බස්නැවතුම්පොලේ තැන් තැන් වල කසළ දැමීමට බොහෝ දෙනා පෙළඹී ඇති බැවින්, විදුලි කණු වල ප්ලාස්ටික් බඳුන් සවි කිරීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් සභාව අමතමින් සඳහන් කරන ලදී. එමෙන්ම කල්තොට පාර හා කහටපිටිය මාර්ගය අබලන් තත්ත්වයේ ඇති බැවින් වහා අළුත්වැඩියා කිරීම කළ යුතු බවට ද එතුමන් දක්වන ලදී.

තමන් සෑම අවස්ථාවක දීම මුස්ලිම් සහ දෙමළ වැසියන්ගේ ප්‍රශ්න සම්බන්ධයෙන් පෙනී සිට ඇති බව ද ගරු මන්ත්‍රීතුමන් විසින් සඳහන් කළ අතර, බොදු බල සේනා සංවිධානයේ ලේකම් ස්වාමීන් වහන්සේ විසින් මෙය සිංහල රටක් බැවින්, කැමති නම් ඉන්න, නැතහොත් යන්න යනුවෙන් ප්‍රකාශයක් කර ඇති බවත්, මෙවන් ආකාරයේ ප්‍රකාශයන් කිරීමට හේතුව තමන් නොදන්නා බවත් ප්‍රකාශ කළේය. යුද්ධයේ දී මුස්ලිම් ජනතාව ද විශාල ප්‍රමාණයක් රට වෙනුවෙන් ජීවිතය පූජා කළ බව ද එතුමන් තව දුරටත් සඳහන් කළේය. අසාද් සාලි මහතාගේ ප්‍රකාශය සම්බන්ධයෙන් කටයුතු කළ ආකාරයට බොදු බල සේනා සංවිධානයේ එම ප්‍රකාශය සම්බන්ධයෙන් කටයුතු නොකිරීම විමතියක් බව ද, නීතිය සියළු දෙනාටම සමාන විය යුතු බවට ද තමන්ට ඇති එකම රට ශ්‍රී ලංකාව පමණක් බව ද සඳහන් කළේය.

13 වන සංශෝධනයට අදාල බලතල පළාත් සභාවලට ලබා දීම කළ යුතු බවත්, ජනාධිපතිවරයා හා ආණ්ඩුකාරවරයා සතු බලතල ඉක්මවීමට පළාත් සභාවලට නොහැකි බවත් ගරු නාගරික මන්ත්‍රීතුමන් ප්‍රකාශ කළේය.

**14:05 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

ගරු උප සභාපතිතුමන් සභාව අමතමින්, අපවත්වී වදාල පූජ්‍ය බෝවත්තේ ඉන්ද්‍රරතන ස්වාමීන් වහන්සේ, උන්වහන්සේ ඉදිරිපත් කළ කරුණු සම්බන්ධව බලවේගයක් ගොඩනැගීමට තමන් වහන්සේ හට තිබූ අවස්ථාව නැති කර ගත් බව ද, උන්වහන්සේගේ අපවත්වීම සම්බන්ධව ශෝකය ප්‍රකාශ කරන බව ද සඳහන් කරන ලදී. පසුගිය හරක් මස් ලංසුවට තමන් අත්සන් නොකළ බව ද, බෞද්ධයන් පරම අවිහිංසාවාදී දර්ශනයක් අනුගමනය කරන්නන් බැවින් ගව ඝාතනයට විරුද්ධ බව ද වැඩිදුරටත් සඳහන් කරන ලදී.

එම සතුන් මරණයට පත් කිරීමට නම් නීතියට අනුව වයස අවුරුදු 12ට වැඩි විය යුතු බව ද, ගොනුන් විය යුතු බව ද, නීරෝගී සතුන් විය යුතු බවට ද, මහජන සෞඛ්‍ය පරික්ෂකවරයා ගේ අනුමැතිය අනුව එම ඝාතනයන් සිදු විය යුතු බවට ද, මරණයට පත් කරන ස්ථානයේ ජලය ආදී පහසුකම් සහිතව එම සත්ත්වයාට ගෞරවයක් වන ආකාරයෙන් පැවතිය යුතු බවට ද ගරු උප සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී. ලබන වර්ෂයේ දී ගව ඝාතන ලංසුව අනුමත කිරීමේ දී මේ නිර්ණායක සම්බන්ධව දැඩි අවධානයක් යොමු කරන බව ද එතුමන් වැඩි දුරටත් දන්වා සිටියේය.

බළන්ගොඩ මිහිඳු පෙරහැර සඳහා මෙම සභාවේ අරමුදලින් රු. 25,000.00ක මුදලක් සහ පොසොන් උත්සවය වෙනුවෙන් රු. 25,000.00ක මුදලක් ලබා දීමට කටයුතු කිරීම සම්බන්ධව ප්‍රසාදය පළ කරන බව ද සඳහන් කළේය.

**14:06 ගරු නාගරික මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා**

ගව ඝාතනය සම්බන්ධව විරුද්ධ පක්ෂයෙන් මීට පෙර කරන ලද යෝජනාව නැවත ගෙන ඒම සම්බන්ධයෙන් ගරු උප සභාපතිතුමන් හට ස්තුතිය පළ කරන බව ගරු නාගරික මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමන් අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලදී. ගව ඝාතනය නැවැත්වීම සඳහා කටයුතු කළ පූජ්‍ය බෝවත්තේ ඉන්ද්‍රරතන හිමියන්ගේ අපවත්වීම සම්බන්ධව බළන්ගොඩ ජනතාව වෙනුවෙන් ශෝකය පළ කරන බව ද එතුමන් තව දුරටත් සඳහන් කරන ලදී.

මෙවර වෙසක් උත්සවය ඉතාමත් උත්කර්ෂවත් අයුරින් පැවැත්වීමට කටයුතු කළ බළන්ගොඩ නගර සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පොලිසිය ඇතුළු සියළු පාර්ශවයන්ට ස්තුතිය පළ කරන බව ද එතුමන් සඳහන් කරන ලදී.

**14:07 ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා**

විපක්ෂය විසින් ගව ඝාතනය සම්බන්ධයෙන් ඡායාරූප, වීඩියෝ දර්ශන ද සහිතව පැමිණිලි කොට එරෙහි වන අවස්ථාවේ දී එයට විරුද්ධව සිටි ගරු උප සභාපතිතුමන් සහ නාගරික මන්ත්‍රීතුමන්ලා දැන් ඒ සම්බන්ධව සහයෝගය පළ කිරීම අගය කොට සලකන බව ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමන් සභාව හමුවේ අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේය.

තමන්ගේ සීයා සහ පියා මෙන්ම බළන්ගොඩ නාගරික ජනතාවට සේවය කිරීමට අවස්ථාව ලැබීම සම්බන්ධව බෙහෙවින් සතුටට පත් වන බව ද, විශේෂයෙන් තමන් ජීවත්ව සිටින ඇල්ලෙපොල ප්‍රදේශයේ ජනතාවට අයවැය මන්ත්‍රී ප්‍රතිපාදන යොදා ගනිමින් 2012 වර්ෂයේ දී ටකරං මඩු සහ පුටු ලබා දීමට කටයුතු කළ බව ද, අද දිනයේ රු. 10,000ක් වටිනා ඇස්බැස්ටෝස් තහඩු අඩුආදායම් ලාභී පවුල් වෙත ලබා දීමට කටයුතු කළ බව ද සඳහන් කළ අතර, ඒ සම්බන්ධයෙන් සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තුතිය පළ කරන ලදී.

ගරු උප සභාපතිතුමන් සහ ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් පෙන්වා දුන් පරිදි අපවත්වී වදාළ පූජ්‍ය බෝවත්තේ ඉන්ද්‍රරතන හිමියන් රට, ජාතිය, ආගම හා සංස්කෘතිය ආරක්ෂා කිරීම හිතට ගෙන කටයුතු කළ හිමිනමක් බවත්, උන්වහන්සේට ජාති, ආගම් බේදයන්ගෙන් තොරව ඉතා දිගු ගමනක් යාමේ හැකියාව තිබූ බවත් සඳහන් කළේය. එසේ වුවත් බුදු රජාණන් වහන්සේ වැඩ සිටි කාලයේ ම මුගලන් මහ රහතන් වහන්සේටත් පෙර කළ අකුසල කර්මයන් විපාක දුන්නා සේ, නොයෙකුත් හේතූන් මත බෝවත්තේ ඉන්ද්‍රරතන හිමියන්ට ද ජීවිතය පූජාකිරීමට සිදු වූ බව ද ගරු නාගරික මන්ත්‍රීතුමන් අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේය. එසේ කිරීමට සිදු වූයේ දිගු කාලයක් තිස්සේ කරන ලද ඉල්ලීම් වලට යහපත් ප්‍රතිචාරයක් නොලැබුණු නිසා බව ද එතුමන් තව දුරටත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම උන්වහන්සේගේ අපවත් වීම සම්බන්ධයෙන් විපක්ෂ නායකතුමන් ඇතුළු සියළු දෙනාගේ ශෝකය පළ කිරීම සිදු කරන බව ද එතුමන් සඳහන් කරන ලදී.

ගරු සභාපතිතුමන් වෙත ලැබී ඇති අසීමිත බලතල යොදා ගනිමින්, උඩ ඇල්ලෙපොල පස් කපන ස්ථානය සම්බන්ධයෙන් ජනතාවට හිතකාමී තීරණයක් ගැනීම කළ යුතු බවට ද, සියළු දෙනාටම නීතිය සමානව බලපැවැත්වෙන බව පෙන්වා දිය යුතු බවට ද ගරු මන්ත්‍රීතුමන් විසින් අදහස් දක්වන ලදී.

ශ්‍රී ලංකාවේ පළාත් සභාවන් නවය අතරින් අටක් මේ වන විට ක්‍රියාත්මක බව ද, එම ක්ෂේත්‍රයේ රැකියාවන්හි නියුතු ලක්ෂ ගණනක් පිරිස් සිටින බැවින්, එම ආයතනික ව්‍යුහයන් ඒ ආකාරයටම තබා ගනිමින් සුදුසු පියවරක් ගැනීමට ඉල්ලා සිටින බව ද ප්‍රකාශ කරන ලදී.

2001 පැවති එක්සත් ජාතික පක්ෂ පාලන සමයේ සංවර්ධනයක් නොවූ බව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ප්‍රකාශ කර ඇති බව ද, එසේ සංවර්ධනයක් නොවූ බව සහ රැකීරක්ෂා ලබා නොදුන් බවට ඔප්පු කර පෙන්වන්නේ නම් තමන් මෙම

තනතුරින් ඉවත් වන බව ද එක්සත් ජාතික පක්ෂය විසින් කොටි ත්‍රස්තවාදය පෝෂණය කළ බවට කෙරෙන ප්‍රකාශයන් ද ප්‍රතික්ෂේප කරන බව ද එතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමන් යුද්ධය නිමා කළ බව පිළිගන්නා බව ද, ශ්‍රී ලංකාවේ සිටි සියළුම නායකයන් තම තමන්ගේ හැකියාවේ හැටියට යුද්ධය නිමා කිරීමට උත්සාහ කළ බව ද, යුද්ධය ජයග්‍රහණය සඳහා එක්සත් ජාතික පක්ෂයෙන් ද ගරු මන්ත්‍රීතුමන්ලා 19ක් ආණ්ඩු පක්ෂයට සහයෝගය ලබා දුන් බව ද එතුමන් විසින් දක්වන ලදී.

*මේ සම්බන්ධව අදහස් දක්වමින් **ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන්** ප්‍රකාශ කර සිටියේ එම අවධියේ සංවර්ධනයක් වූයේ නම් ඒ ඉතා සුළු වශයෙන් බවත්, එජාපය යුද්ධය විකුණාගෙන කෑම සිදු කළ බවත්, යුද්ධ කාල සීමාවේ දී 'අලිමංකඩ කියලා පාමංකඩ යනවා' වැනි ප්‍රකාශයන් විපක්ෂයේ ජ්‍යෙෂ්ඨ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා පවා ප්‍රකාශ සිදු කළ බවත් සඳහන් කළේය. එසේ විශාල සංවර්ධනයක් සිදු වූ බවට පෙන්වන මෙන් තමන් ද ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන්ට අභියෝග කරන බවත් වැඩිදුරටත් සඳහන් කළේය.*

## 15. අවසානය

**ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමන් මහා සභාව අමතමින්, මෙවර සභාවේ දී සභාවේ සීමාවන්ට අදාල නොවන අනවශ්‍ය කරුණු ද සංවාදයට ලක් වූ බව දැක්වූ අතර, සභාවේ විෂය සීමාවන්ට අදාල කරුණු සංවාදයට ගැනීම වඩාත් ඵලදායක වන බව සඳහන් කළේය. සියළුම දෙනා යුද්ධය අවසන් කිරීමට සහයෝගය දැක්වූ බව ද එතුමන් ප්‍රකාශ කරන ලද අතර, අපගේ කාර්ය භාරය නගර සභා ආඥාපනතට සීමාව වන බව ද ප්‍රකාශ එතුමන් තව දුරටත් ප්‍රකාශ කළේය.

මෙදින මහා සභා රැස්වීම් වාරයට සහභාගී වූ ගරු උප සභාපතිතුමන්, නාගරික මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ පුවත්පත් කලාවේදීන් ඇතුළු සියළු දෙනා හට ස්තුතිවන්ත වන බව ද සඳහන් කරමින් ගරු සභාපතිතුමන් සියළුම දෙනාට යහපත් අනාගතයක් ප්‍රාර්ථනා කරමින් 2013 මැයි මාසයට අදාල බළන්ගොඩ නගර සභාවේ මහා සභා රැස්වීම් වාරය නිමා කරන ලදී

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,<br>
සභාපති,<br>
බළන්ගොඩ නගර සභාව.